ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1992/72 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 43 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 04 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩල නීතිය), 22(අ) වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 43 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 04 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය, 22(අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ප්‍රදේශ, මේ පනතේ කාර්යය සඳහා බලපත්‍ර සහිත කලාප වශයෙන් මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය 1

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නැගෙනහිර උඩපොල ඕතොට කෝරළේ, බටහිර දඹදෙනි හත්පත්තුවේ අංක 933 දරන සෙරාපීස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කුලීපිටිය ගමේ පිහිටා ඇති (ටී. පී. 118723 දරන ඉඩමේ කොටසක් වූ) ඊදල්ල වත්ත - සෙරාපීස්, ගොවිපල යනුවෙන් හඳුන්වනු ලබන (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වන එච්. කේ. මහින්ද මහතා විසින් සාදන ලද 1999 අප්‍රේල් 12 දින අංක 99/01 දරන පූර්ව අනුරේඛන සටහනේ දක්වා ඇති ලොට් අංක 1 සහ ලොට් අංක 2 හි නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වූ) බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වන එච්.කේ. මහින්ද මහතා විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 27 දින අංක 476 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර පනහක් (අක්කර 50 රූඩ් 0 පර්. 0) හෙවත් හෙක්ටයාර් විස්සයි දශම දෙකයි තුනයි හතරයි තුනක් වූ (හෙක්යාර් 20.2343) වූ බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් වැඩි දියුණු කිරීම් වේ.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එම ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | - | කුඩා ඔය සහ දුම්රිය මාර්ගය සඳහා වෙන් කළ ඉඩම ද; |
| නැගෙනහිරට | - | සෙරාපීස් ගොවිපල ඉඩමේම ඉතිරි කොටසක් ද; |
| දකුණට | - | සෙරාපීස් ගොවිපල ඉඩමේම ඉතිරි කොටසක් සහ ප්‍රධාන මාර්ගය ද; |
| බටහිරට | - | ප්‍රධාන මාර්ගය, මාර්ගය, ඉහලගම ජනඋද්‍යානගම සහ කුඩා ඔය ද වේ. |

## උපලේඛනය 2

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නැගෙනහිර උඩපොල ඕතොට කෝරළේ, බටහිර දඹදෙනි හත්පත්තුවේ අංක 933 දරන සෙරාපීස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිහිටා ඇති (කෑගල්ල ප්ලාන්ටේෂන් පීඑල්සී ආයතනයට සම්බන්ධිත) ඊදූල්ල වත්ත - සෙරාපීස් කොටස යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එම්. පී. අයි. කේ. පතිරණ මහතා විසින් සාදන ලද 2014 මාර්තු මස 26 දින අංක 1452 දරන මිනින්දෝරු පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්කර පහළොවක් (අක්කර 15 රූඩ් 0 පර්. 0) හෙවත් හෙක්ටයාර් හයයි දශම බිංදුවයි හතයි බිංදුවයි දෙකක් වූ (හෙක්යාර් 6.0702) වූ බෙදා වෙන් කල ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු දේ ද වේ.

එම ඉඩමට අදාළ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | - | පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය ද; |
| නැගෙනහිරට | - | ඊදූල්ල වත්තේ ඉතිරි කොටසක් ද (සෙරාපීස් කොටස) ; |
| දකුණට | - | වතු මාර්ගය ද; |
| බටහිරට | - | ඊදූල්ල වත්තේ ඉතිරි කොටසක් ද (සෙරාපීස් කොටස) සහ පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය ද වේ. |

11 - 1269

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.